ජගත් ජේ එදිරිසිංහ

# කටු

## 2



නිරාෂා විදුලගේ ලියන මේසය මත අපිළිවෙලට විසිරී තිබූ පොත් සියල්ල එකතු කර පොත් රාක්කයෙහි තැබුවා ය. තමාගේ පොත් පත් අත පත ගානවාට විදුල කැමති නැති බව ඇය දනියි. එසේ වුවද මේසය පිසදමන්නට නම් මේ අවුල් ජාලය නිසි පිළිවෙලකට තැබිය යුතුම ය.

"මගේ මේසෙ අවුල් තමයි.. ඒත් ඒ අවුල මැද මට අවශ්‍ය පොත හරි කඩදාසිය හරි තියෙන තැන මං හරියටම දන්නවා.." ඔහු ඇයට කීවේ ඔහු සමග මේ නිවසේ වාසයට පැමිණි පළමු සතියේදීම ය. එසේ වුවද හැකි සෑම විටම ඔහුගේ මේසය අස්පස් කර තැබීමේ පුරුද්දෙන් මිදෙන්නට ඇයට නොහැකි විය.

මේසය මත වූ අලු බඳුන අඩක් දැවී ගිය දුම්වැටි වලින් පිරී ඇත. මුල් කාලයේ ඔහුගේ දුම් බීමෙ පුරුද්ද ගැන නෝක්කාඩු කීවද පසුව ඇය ඒ උත්සාහය අත්හැර දැමුවා ය. මේ ඔහුගේ ජීවිතයයි. එය වෙනස් කරන්නට තැත් කිරීම නොකළ යුත්තකි. ඔහුගේ ජීවිතය හා එක් වූයේ කිසිවක් වෙනස් කරන්නට නොව ඒ තාක් ඔහු සමගින් සබැඳි සියල්ල සමගින් ඉදිරියට යන්නට ය. එවන් පොරොන්දුවක්ද ඇතිව ය.

විදුල නම් වන හිතුවක්කාර නිර්මාණකාරයා ඔහු හා සබැඳි හොඳ හා නරක සියල්ලේම සම්මිශ්‍රණයක් බව මුල සිටම ඈ වටහා ගෙන සිටියා ය.

විදුල වැඩට යනවිට දහයත් පසුවන්නට ඇතැයි නිරාශාට සිතෙයි. පිබිදුණ වේලාවේ සිට පෙරදා ඇය විසින් මැද තබන ලද ඇඳුමින් සැරසී නිවසින් පිටවන්නට ඔහු පැය බාගයක් වත් ගත නොකරයි. ඔහු තේ කෝප්පය බොන්නේ ද දුවමින් ය. නිවසින් පිට වන්නට පෙර සුපුරුදු ලෙස ඇගේ හිස මත අත තබා ඇගේ කොණ්ඩය අවුල් කර දමන්නට ද ඒ අතරේ ඔහු අමතක නොකරයි. සැමදිනකම අමතක කරන එකම දෙය බත් පාර්සලයයි. අදත් පිටත්වන්නට ඔන්න මෙන්න කියා සිටි ඔහුගේ කාරය වෙත දුව ගොස් බත් සාර්සලය ඔහු අතට දෙන්නට ඇයට සිදුවිය.

"මං පව් නේද කියලා අමාරුවෙන් උදේ පාන්දර නැගිටලා බත් උයනවා.. මෙයා ඒක අමතක කරලා දුවනවා.." ඇය නෝකකාඩුවක් ද කීවා ය.

විදුලගේ මේසය ඉදිරියේ වාඩි වූ නිරාෂා අඩක් ලියා නිම කළ තිර පිටපත පෙරළා බැලුවා ය. ඔහුගේ අත් අකුරු රළු ය. එසේ වුවද කියවන්නට අපහසු නැත. එක දිගට පැය ගණන් ලියන ඔහු සමහර විටෙක සිය ලිවිල්ල නවතා දමා මිදුලට බසියි. දුම් වැටියක් දල්වා ගනියි. ඇවිදියි. නැත්නම් ඇය යමක් කරන තැනට පැමිණ ඔහේ බලා සිටියි.

"ඇයි..?" ඇය අසයි.

"රයිටර්ස් බ්ලොක්" ඔහු කියන්නේ සිනාසෙමින් ය. ".. පොඩ්ඩක් නිදහසේ හිටියාම අලුත් අදහස් හිතට එනවා.."

"ඇවිද ඇවිද ඉන්න වෙලාවෙ මගෙන් ඇහුව නම් මං ඕනෙ තරම් අලුත් අදහස් දෙනවනෙ.." ඇය කවට කම් කරයි.

"ඇත්ත නේන්නං.. ඒත් ඔයාගෙ අදහස් මට දිරවා ගන්න බැරි තරම් බරයි.." ඔහු කියයි.

"බරයි..? මං මෙච්චරකල් හිතා හිටියෙ ඔයාගෙ ඔලුව ඕනෙ බරක් දරා ඉන්න පුලුවන් තරම් ශක්තිමත් කියලයි.. කලු ගලක් වගේ.. එහෙමත් නැත්නම් යකඩයක් වගේ... අපරාදෙ..! මං රැවටිලා"

සාරංගා අමරසූරිය නම් වන විශ්ව විද්‍යාල ශිෂ්‍යාව කථිකාචාර්ය නිශ්ශංක කරුණාසේකර ගේ කාමරයෙන් පිටවන තැන දී විදුල ගේ තිර පිටපත නැවතී ඇති බව නිරාෂාට පෙනෙයි. සාරංගා කථිකාචාර්යවරයා ගේ කාමරයට ගියේ ඇගේ කැමැත්තෙන්ම ය. ඒ සඳහා ඇය පොළඹවන, ඇය දිරිමත් කරවන හැසිරීමක් නිශ්ශංක ගෙන් ඇයට ලැබී ඇති බව තිරනාටකයෙන් පෙනෙයි. ඔහුගේ විෂයයයෙන් ඉහළ සාමාර්ථයක් කෙසේ හෝ ලබා ගැනීම ඇගේ අභිප්‍රායයි. මේ ඒ වෙනුවෙන් ඇය ඔහුට ලබා දෙන අල්ලසයි. තමන් ඒ අල්ලස බලාපොරොත්තු වන බවට වූ ඔහු ගේ ඇඟවීම් තිර පිටපතේ තැනින් තැන් දක්නට ඇත.

සාරංගාගේත් නිශ්ශංකගේත් එක්වීම විදුල අතින් ශූර ලෙස ලියැවී ඇතැයි නිරාශාට සිතුණි. ඒ එක්වීම තුළ ආදරයක් හෝ වෙනයම් බැඳීමක් හෝ නැත. සියල්ල යාන්ත්‍රික ය. යම් සේවාවක් වෙනුවෙන් ඔහු නියම කළ මිල ඇය ගෙවා දමමින් සිටියි. හුදු ගනුදෙනුවකින් සියල්ල හමාර වෙයි. සාරංගා තවත් මොහොතකුදු පමා නොවී කාමරයෙන් පිටව එයි. කඩිනමින් පඩිපෙළ බැස එන ඇය අවසන් පඩිය මත වාඩි වෙයි. දෝතින් මුහුණ වසා ගන්නා තරුණිය මොහොතක් දෙදණ මත හිස තබා ගනියි.

ඉන් පසු විදුල ලියූ වාක්‍ය කීපය කටුගා ඇත.

00000000000

සහන සේවා පදනමේ කාන්තා නිවස්නයේ මහ ගේට්ටුවෙන් වාහනය ඇතුල් වන විටත් විදුල සිටියේ විශාල කල්පනාවක ය. මදාරා වෛද්‍යසේකර හමුවී කතා කරන්නට මහත් උවමනාවක් ඊයේ රාත්‍රියේ සිට ම ඔහු සිත පීඩා කරමින් රැඳී සිටියි. පුනරුත්ථාපන ප්‍රතිකාර වලින් පසු මදාරා තවත් සතියකින් මේ නිවස්නයෙන් පිටව යන බව ඔහු දැන සිටියේ ය. ඇය පිටව යන්නට කලින් ඇගෙන් අසා දැනගත යුතු බොහෝ දේ ඇත.

විදුල මුලින්ම ඇය හා කතා කළේ ප්‍රතිකාර ඇරඹෙන්නට සතියකට දෙකකට පෙර දිනයක ය. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ තරුණිය පිලිබඳ රහස්‍ය වාර්තාව සකස් කිරීම ඔහුට පැවරී තිබුණි. ඔහු සිටියේ මානසික වෛද්‍ය පතිරණ සමගින් ය. ඇය පිළිබඳ දළ විස්තරයක් ඔහුට ලැබී තිබුණද ඇය මේ